# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/06 – 2022 අගෝස්තු 08 වැනි සඳුදා – 2022.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/97.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු සේවකයන් 14 දෙනා, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැප්පෙටිපොල, කළුබුළුලන්දල, වියාල කුඹුර, නීතිඥ එල්. ඒ. එම්. නිමල් අබේසිංහ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනුෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජූලි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/97.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු සේවකයන් 14 දෙනා, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ සේවකයින් වන ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 14 දෙනා විසින් ඉල්ලා ඇති,

1. නිසි පරිදි MSD 25 චක්‍රලේඛණයට අනුව, එම ශ්‍රේණිවල පිහිටු වීම.
2. නිසි ක්‍රමවේදයකට අනුව, 30/2006 චක්‍රලේඛයේ (MM 1-1) වැටුප් පියවරෙහි පිහිටුවීම.
3. ඊට සමගාමීව හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබා දීමට කටයුතු කිරීම.

යන ඉල්ලීම් ලබා ගැනීමට හිමිකමක් හිමි ද ? යන්නත් එසේ හිමිකමක් තිබේ නම් සිදුවී ඇති අසාධාරණය සම්බන්ධයෙන් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් වේ. ''

1. ඩී. ඒ. අනිල් නිශාන්ත මයා
2. පී. බන්දුල ශ්‍රී පද්මලාල් ද සිල්වා මයා
3. අයි. ශ්‍යාමා ප්‍රියදර්ශනී ජයසිංහ මෙය
4. එම්. තයාපරන් මයා
5. කේ. අමරදාස මයා
6. කේ. ඩබ්. කිත්සිරි කුමාර මයා
7. කේ. බී. වී. එස්. කල්‍යානප්‍රිය මයා
8. එම්. ජී. සරත් මයා
9. එම්. අයි. රූපසිංහ මිය
10. ඩී. ඩී. නිශාන්ත මයා
11. වී. මේනුකා ශ්‍රියානි අල්විස් මිය
12. තමරි මහවිතාන මිය
13. ඒ. පී. හෙට්ටිආරච්චි මිය
14. ඩී. ජී. නයනා වික්‍රමසුන්දර මෙය

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජූලි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0047

---

මගේ අංකය: IR/COM/03/2020/187.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

පී. ජී. එස්. වික්‍රමතුංග මයා, අංක 55, වට්ටාරන්තැන්න පැසේජ්, මහනුවර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, අඹන්පොල, බවනපුර, අංක 04, නීතිඥ ඩී. එම්. එම්. බී. බක්මීවැව මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ජූලි මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2020/187.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

පී. ජී. එස්. වික්‍රමතුංග මයා, අංක 55, වට්ටාරන්තැන්න පැසේජ්, මහනුවර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''පී. ජී. එස්. වික්‍රමතුංග මයාගේ සේවාරම්භක වැටුප් පියවර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 460 අනුව සකස් නොකිරීම තුළින් ඒ මහතාට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳ ව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජුනි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0048

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.